*සැ. යු.* — *මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2012 වර්ෂයේ ජනවාරි සිට මාර්තු දක්වා වූ කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වේ.*

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,875 - 2014 අගෝස්තු මස 08 වැනි සිකුරාදා - 2014.08.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I කොටස : (III) වැනි ඡේදය - වෙළෙඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| වෙළෙඳ ලකුණු පිළිබඳ දැන්වීම් ... ... | — |
| වෙළෙඳ ලකුණු පිළිබඳ නිවේදන ... ... | — |
| පේටන්ට් බලපත්‍ර පිළිබඳ නිවේදන ... ... | 318 |
| කාර්මික සැලසුම් පිළිබඳ නිවේදන ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | — |


*සැ. යු.* — සත්මෙත්සිත්හවුල සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2014 ජූලි මස 18 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන්, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 අගෝස්තු මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 අගෝස්තු මස 15 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක් නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය, හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ.බ.)

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

317 -B 80863—310 (2014/08)
C1-

# පේටන්ට් බලපත්‍ර පිළිබඳ නිවේදන

## වෙළෙඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළෙඳ ලකුණුවලට අදාළ සියලු ම ලියුම් කියුම් කොළඹ 10, ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 400, "සමාගම් මැදුරේ" 3 වැනි මහලේ පේටන්ට් බලපත්‍ර සහ වෙළෙඳ ලකුණු ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ පේටන්ට් බලපත්‍ර සහ වෙළෙඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතු ය.

## පරීක්ෂා කිරීමේ වේලාවන්

සතියේ සෑම ක්‍රියාකාරී දිනක ම පෙරවරු 9.00 සිට පස්වරු 3.30 දක්වා ලේඛන පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා ඉල්ලුම්පත්‍ර සතියේ වැඩ කරන දිනවල පස්වරු 2.00 දක්වා පමණක් භාරගනු ලැබේ.

## වර්ණවලට සීමාවූ වෙළෙඳ ලකුණු

ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළෙඳ ලකුණක් යම් යම් වර්ණයකට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමග ඉදිරිපත් කරනු ලබන වෙළඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

## ආශ්‍රිත කිරීම

මෙහි පළ කර ඇති ලකුණක් , 1979 අංක 32 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහ පනතේ 112 වැනි වගන්තිය යටතේ, තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිතා කරනු ලබන බවට සඳහන් කර ඇති කල්හි එම වෙළෙඳ ලකුණට දී ඇති අංකය ද දක්වනු ලැබේ.

## විරෝධතා දැක්වීම

පහත සඳහන් වෙළෙඳ සේවා හෝ සාමූහික ලකුණු ලියාපදිංචි කිරීම ගැන විරෝධතාවය දැක්වීමට හේතු ඇති යම් කෙනෙකු මෙම *ගැසට් නිවේදනයේ* දින සිට තුන් මාසයක් ඇතුළත ඇම් 2 දරන ආකෘති පත්‍රය (අනු පිටපතකින් ද යුක්තව) මගින් විරෝධතා දැක්වීම ඉදිරිපත් කළ යුතු ය. එබඳු විරෝධතා දැක්වීමක් සඳහා ගාස්තුව රු. 750ක් වන අතර එම ගාස්තුව මුදලින්, චෙක්පතකින්, මුදල් ඇණවුමකින්, තැපැල් ඇණවුමකින් හෝ බැංකු අණකරයකින් ගෙවිය යුතු ය.

---

## නිවේදනය

**2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත**

(79 (2) (ආ) වගන්තිය )

මෙම නිවේදනය පළ කිරීමෙන් මාස 3ක් ඉකුත් වීමෙන් පසුව පහත සඳහන් ඉල්ලුම්කරුවන්ට පේටන්ට් බලපත්‍ර ලබා දීමට හැකි බව මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

(1) - (1) ඉල්ලුම්පත්‍ර අංකය: 15852; (2) ඉල්ලුම්කරු : යුනිවර්සිටිපුත්‍ර මැලේසියා ; (3) නව නිර්මාණයේ නම: අති පිරිසිදු පොල්තෙල් (වර්ජින් කොකනට් ඔයිල්), ආහාර පිසීමේ තෙල් නිපදවීම සහ පොල් ජෛව ඉන්ධන සඳහා අමුද්‍රව්‍ය නිපදවීම සම්බන්ධ ක්‍රියාවලි;

(2) - (1) ඉල්ලුම්පත්‍ර අංකය: 16100; (2) ඉල්ලුම්කරු : විපුල ධර්මදාස; (3) නව නිර්මාණයේ නම: ගල් කැඩීමේ උපකරණය හා ඒ සම්බන්ධ ක්‍රමවේදය;

(3) - (1) ඉල්ලුම්පත්‍ර අංකය: 16195; (2) ඉල්ලුම්කරු : කුරුම්බලාපිටි ආරච්චිගේ ධම්මික කුරුම්බලාපිටිය ; ජය අබේසිංහ ගුණවර්ධන (3) නව නිර්මාණයේ නම: තනිකලා ප්‍රත්‍යාවර්තක ධාරා උපකරණය දුරස්ථව සිට ක්‍රියාත්මක කිරීම සහ ක්‍රියා විරහිත කිරීම සිදුකිරීම සඳහා වන මෙවලම ;

(4) - (1) ඉල්ලුම්පත්‍ර අංකය: 16248; (2) ඉල්ලුම්කරු : ජගත් පාලිත විද්‍යාරත්න ; (3) නව නිර්මාණයේ නම: පරිගණකයේ සිට ශ්‍රව්‍ය පද්ධති කරා අධි අනුකූලතාවය (ධ්වනි පද්ධතිවල) සහිත රැහැන් රහිත සම්බන්ධකය ;

(5) - (1) ඉල්ලුම්පත්‍ර අංකය: 16782; (2) ඉල්ලුම්කරු : පහල ගමගේ කරුණාතිස්ස ; (3) නව නිර්මාණයේ නම: රබර් ගස්වල කිරි කැපීමේදී එම කැපුම් ඡේදනය සහ රබර් කිරි එකතු කිරීමේ භාජනය වැසි ජලයෙන් ආරක්ෂා කිරීම සඳහා වන ක්‍රමවේදය ;

(6) - (1) ඉල්ලුම්පත්‍ර අංකය: 16985; (2) ඉල්ලුම්කරු : කෝදාගොඩ විතානගේ නදීක උදයකාන්ත මෙත්තානන්ද ; (3) නව නිර්මාණයේ නම: ජීවිතාරක්ෂක රසායනික වායු බැලූනය ;

(7) - (1) ඉල්ලුම්පත්‍ර අංකය: 17115; (2) ඉල්ලුම්කරු : වීරසිංහ මුදියන්සේලාගේ නිශාන්ත නන්දන වීරසිංහ ; (3) නව නිර්මාණයේ නම: කිලෝවොට් ඇම්පියර් පාලකය ;

(8) - (1) ඉල්ලුම්පත්‍ර අංකය: 17522; (2) ඉල්ලුම්කරු : එම්. පී. ආර්. මල්ලව ; (3) නව නිර්මාණයේ නම: ඉන්ධන නොවන ද්‍රව තෙරපුම් එන්ජිම.

08 - 358